# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2488/11 - 2026 මැයි මස 12 වැනි අඟහරුවාදා - 2026.05.12**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(X)(ඈ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන සහ 70ඇ වන වගන්ති සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සහ පීඑල් 00303869 ලියාපදිංචි අංකය දරන සමාගමක් වන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2025 සැප්තැම්බර් මස 22 වන දින අංක 2455/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ I වන උපලේඛනයේ "තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය" යන්නට අදාළ සටහන්වලට ඉක්බිතිව ම, පහත සඳහන් සටහන් එකතු කිරීම මගින් එකී උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

| *I වන තීරය*<br><br>*උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br><br>*උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br><br>*කොන්දේසි* |
|---|---|---|
| සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ඉංජිනේරු (ගෞරව) (සිවිල් ඉංජිනේරු විද්‍යාව) | (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ('C') දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථයක් ('S') එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම තිබීම; සහ. |


1A - PG 7700 - 283 (2026/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I වන තීරය*<br><br>*උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *II වන තීරය*<br><br>*උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා වන කෙටි යෙදුම* | *III වන තීරය*<br><br>*කොන්දේසි* |
|---|---|---|
| | | (ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (‘S’) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම. |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2026 මැයි මස 11 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 - 0160